# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/20 – 2018 ජූලි 03 වැනි අඟහරුවාදා – 2018.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 151 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/15/2017/වීඊ/355.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බීයූ/එල්එන්/1/1/35.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූනි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, බුලත්සිංහල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරගොඩ ගමේ පිහිටි, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක කේජ්/ඩීඑස්ඕ/18/156 හා 2018.04.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඔෂින්ටන් වත්ත – ප්‍රමාණය: හෙක්. 5.5841**
උතුරට: මාර්ගය සහ ඒ. ර්බට් හිමිකම් කියන කබිල්ලගොඩ මානාන; නැගෙනහිරට: ඒ. ර්බට් හිමිකම් කියන කබිල්ලගොඩ මානාන, ඇළ සහ හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත සහ දඹලඇළ වත්ත; දකුණට: කැබලි අක්ෂර බී, හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත, දඹලඇළ වත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0418**
උතුරට: කැබලි අක්ෂර ඒ සහ ඒ. ර්බට් හිමිකම් කියන කබිල්ලගොඩ මානාන; නැගෙනහිරට: ඒ. ර්බට් හිමිකම් කියන කබිල්ලගොඩ මානාන සහ කැබලි අක්ෂර සී; දකුණට: කැබලි අක්ෂර සී, හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

1A – G27989 – 27 (2018/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'සී' – ඔෂින්ටන් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.4012**

උතුරට: කැබලි අක්ෂර බී, ඒ. ඊබට් හිමිකම් කියන කබිල්ලගොඩ මානාන, හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත සහ එච්. එන්. පුෂ්පකුමාරි හිමිකම් කියන ඉබ්වලදෙනිය *හෙවත්* දඹලඇළ ඕවිට; නැගෙනහිරට: ඒ. ඊබට් හිමිකම් කියන කබිල්ලගොඩ මානාන, හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත සහ එච්. එන්. පුෂ්පකුමාරි හිමිකම් කියන ඉබ්වලදෙනිය *හෙවත්* දඹලඇළ ඕවිට; දකුණට: හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී.

04. **කැබලි අක්ෂර 'ඩී' – ප්‍රමාණය: හෙක්. 0.0431**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ සහ හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත; දකුණට: හොරණ වැවිලි සමාගම හිමිකම් කියන ඔෂින්ටන් වත්ත සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

07 – 535

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.